# ටෙන්ඩර් දැන්වීමයි

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

## සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි පරිලෝකනය කිරීම, සූචිගත කිරීම සහ ලේඛනාගාරගත කිරීම සඳහා ලේඛන සකස් කිරීම පිණිස මිල ගණන් කැඳවීමයි

1. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ පරිලෝකනය කිරීම, සූචිගත කිරීම සහ ලේඛනාගාර ගත කිරීම සඳහා ලේඛන සකස් කිරීමට පිළිගත් ආයතනයන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. 2021.06.30 න් අවසන් වූ වසර තුන තුළදී අවම වශයෙන් එක් පිළිගත් මහා පරිමාණ ආයතනයකට ඒ හා සමාන සේවාවක් සැපයීමේ පළපුරුද්ද සහිත ආයතනවලට මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.

2. 2021.09.22 දින සිට 2021.10.07 දින අතර බැංකු කටයුතු සිදු කරනු ලබන දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ නො 13, ලොයිඩ්ස් ගොඩනැගිල්ල, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 හි පිහිටි, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා හා විමසීම් කවුළුවෙන්, අදාළ ටෙන්ඩර පත්‍රිකා ලබා ගත හැකිය. එසේත් නැතිනම්, ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ (www.cbsl.gov.lk) "ටෙන්ඩර් දැන්වීම්" යටතේ හෝ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ (www.epf.lk) "සේ.අ.අ. ටෙන්ඩර්" යටතේ අදාළ ටෙන්ඩර පත්‍රිකා බාගත කල හැක.

3. මිල ගණන් කැඳවීමට අදාළ ටෙන්ඩර් පත්‍රිකා කවරයේ ඉහළ වම් කෙළවර, " ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ පරිලෝකනය කිරීම සූචිගත කිරීම සහ ලේඛනාගාර ගත කිරීම සඳහා ලේඛන සකස් කිරීමට පිළිගත් ආයතනයන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවීම " යනුවෙන් සඳහන් කොට නො 13, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 ලිපිනයේ පිහිටි, ලොයිඩ්ස් ගොඩනැගිල්ලෙහි තබා ඇති ටෙන්ඩර් බහාලුම වෙත දැමිය හැකිය. නොඑසේ නම්, අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, 12 වන මහල, 5 වන කුළුණ, නො.30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය.

4. 2021.10.07 දින ප.ව. 2.30 ට ටෙන්ඩර් කැඳවීම අවසන් කරනු ලබන අතර, ඒ විගස ශ්‍රී ලංකා මහ බැංකුව, නො.30, ජනාධිපති මාවත, කොළඹ 01 හි 5 වන කුළුණේ, 12 වන මහලේ, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ රැස්වීම් ශාලාව තුළ දී ලංසු පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුට හෝ බලයලත් නියෝජිතයෙකුට ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින ආරක්ෂක විධිවිධානවලට සහ මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන කොවිඩ් -19 වැළැක්වීමේ ක්‍රම වලට යටත්ව එම අවස්ථාවට සහභාගී වීමට ඉඩ සැලසේ.

5. දුරකථන අංක 011-2477969/011-2477962 ඔස්සේ පරිපාලන අංශයේ සහකාර අධිකාරී හෝ 011 2477982 ඔස්සේ පුද්ගලික ලේකම්/ සේ.අ.අ. අධිකාරී ඇමතීමෙන් වැඩි විස්තර ලබා ගත හැකිය. විද්‍යුත් තැපෑල: tenders.epf@cbsl.lk

**අධිකාරී**
**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව,**
**නො.30, ජනාධිපති මාවත, කොළඹ 01**
දුරකථන : 011-2477982, 011-2477962 විද්‍යුත් තැපෑල : tenders.epf@cbsl.lk වෙබ් අඩවිය: www.epf.lk